# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1995/13 - 2016 නොවැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2016.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඩීඅයිකේ/එල්ඒඑන්/02/30/33.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්මලේ ග්‍රාම නිලධාරි වසමේ බඹරැන්ද මධ්‍යම සහ බඹරැන්ද දකුණ ගමේ පිහිටි මාතර ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අංක මූ. පි. මාර 2646 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්;

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: සුරවීරගෙමාකීරිය; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රත්මලේ ''විජය'' හි පදිංචි නන්දන විජයසිරි විදානගමගේ; ප්‍රමාණය: හෙක්. 0.0022.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: සුරවීරගෙමාකීරිය; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: මාතර හක්මන පාර, ගබඩා වීදිය, අංක 36/13 හි පදිංචි අනිල් ප්‍රීතිලාල් සමරසිංහ; ප්‍රමාණය: හෙක්. 0.0156.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: සුරවීරගෙමාකීරිය; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රත්මලේ, තලහිටියාගොඩ පදිංචි කොරනේලිස්, බතීගම, බිබුලෙගෙදර පදිංචි වීරසේන කස්තුරිආරච්චි, රත්මලේ, තලහිටියාගොඩ පදිංචි චන්ද්‍රසිරි මලවිආරච්චි සහ රත්මලේ පදිංචි එස්. කුලතුංග හා තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0562.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2016.12.28 වැනි දින පෙරවරු 10.30 ට, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2016.12.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2016 නොවැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දික්වැල්ල

12 - 580



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ව/18/84/2011/11.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2012/D/300.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අංක 1988/21 හා 2016.10.12 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* තෙවැනි කොටසේ මුල් පිටුවෙහි වත්තල ප්‍රාදේශීය ලේකම් විසින් පළ කරන ලද ගම් 3992 මූලික පිඹුරේ කැබලි අංක 1 සහ 2න් දක්වා ඇති ඉඩම් සම්බන්ධයෙන් වත්තල ප්‍රාදේශීය ලේකම් සම්මුඛ වියයුතු ලෙස හා ලිපි ලේඛන භාර දියයුතු දිනයන් ලෙස දක්වා ඇති දිනය වන ''2016 ඔක්තෝබර් 31'' යන්න වෙනුවට ''2017 ජනවාරි 30'' යන්න ආදේශ විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2016 නොවැම්බර් මස 22 වැනි දින
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 581

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.